# අමානා බැංකුවේ ජංගම යෙදුමට (Mobile App) අදාළ රහස්‍යතා ප්‍රතිපත්තිය

අමනා බෑන්ක් පීඑල්සී විසින් ස්මාර්ට් දුරකථන හා උපාංග වල භාවිතය සඳහා නිර්මාණය කරන ලද ජංගම යෙදුම භාවිතා කිරීම මෙම රහස්‍යතා ප්‍රතිපත්තියට යටතේ වේ.

## යෙදුම මගින් ලබාගන්නා තොරතුරු මොනවාද? එම තොරතුරු භාවිතා වන්නේ කුමකටද?

## පරිශීලකයන් ලබාදෙන තොරතුරු

පෞද්ගලික අනන්‍යතා තොරතුරු සහ වෙනත් තොරතුරු වශයෙන් පරිශීලකයන් ලබාදෙන තොරතුරු වර්ග දෙකකි. පෞද්ගලික අනන්‍යතා තොරතුරු යනු ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම හා සම්බන්ධ ඕනෑම තොරතුරකි (ඒවාට නම, ලිපිනය, දුරකථන අංකය, ගිණුම් අංකය/අංක, පරිශීලක නාමය සහ මුරපදය ඇතුළත් නමුත් ඒවාට සීමා නොවේ). වෙනත් තොරතුරු යනු පෞද්ගලික අනන්‍යතා තොරතුරු සහ ස්වයංක්‍රීයව එකතු කරන ලද තොරතුරු හැර වෙනත් ඕනෑම තොරතුරකි (ඒවාට දීමනා හා ප්‍රවර්ධන සම්බන්ධ තොරතුරු සහ ගනුදෙනු සම්බන්ධ තොරතුරු ඇතුළත් නමුත් ඒවාට සීමා නොවේ).

ගනුදෙනු සම්බන්ධ තොරතුරු වලට තැන්පතු සහ ණය ගිණුම්, ගිණුම් සම්බන්ධ විමසීම්, ශේෂය විමසීම්, ගනුදෙනු ඉතිහාසය, ස්ථාවර නියෝග ගනුදෙනු, මුදල් මාරු කිරීම්, ප්‍රවර්ධන සහ දීමනා සහ සම්බන්ධතා තොරතුරු ඇතුළුව අදාළ සියලු තොරතුරු ඇතුළත් වේ.

ජංගම දුරකථන බැංකුකරණ සේවාව ලබාගැනීමට කැමති ගනුදෙනුකරුවන් ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත ගොස් ඒ සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය වේ. ගනුදෙනුකරුවන් ජංගම දුරකථන බැංකුකරණ යෙදුම තමන්ට අදාළ App Store (Play Store – Google හෝ AppStore - Apple) වෙතින් බාගත කරගත යුතු ය. යෙදුම බාගත කිරීම මගින් ගනුදෙනුකරු එහි ක්‍රියාකාරීත්වයට අදාළ නිසි අවසරයන් ලබාදුන් ලෙස සැලකේ.

ඔබට වැදගත් වන තොරතුරු දැනුම් දීම්, අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සහ ඕනෑම ආකාරයක විමර්ශන කටයුතු සඳහා, ජංගම බැංකුකරණ සේවාව සඳහා ලියාපදිංචි වීමේදී ඔබ ලබාදුන් තොරතුරු අප විසින් කලින් කලට භාවිතා කරනු ලැබීමට ඉඩ ඇත.

## ස්වයංක්‍රීයව එක්රැස් කරගනු ලබන තොරතුරු

ඉහත සඳහන් ආකාරයට රැස්කරගනු ලබන තොරතුරු වලට අමතරව, ඔබට වඩාත් හොඳ සේවාවක් සැපයීම සඳහා තාක්ෂණික හේතූන් හෝ ව්‍යාපාරික අවශ්‍යතා මත යෙදුම මගින් ස්වයංක්‍රීයව යම් යම් තොරතුරු රැස්කර ගැනීමට ඉඩ ඇත. මේ තොරතුරු වලට පහත සඳහන් තොරතුරු සහ වෙනත් තොරතුරු ඇතුළත් වීමට ඉඩ තිබේ.

අ) භාවිතා කරන ජංගම උපාංගයේ වර්ගය

ආ) භාවිතා කරන ජංගම උපාංගයට අදාළ විශේෂ වූ අනන්‍යතාව

ඇ) භාවිතා කරන ජංගම උපකරණයේ IP ලිපිනය

ඈ) ජංගම උපාංගයේ මෙහෙයුම් පද්ධතිය

ඉ) භාවිතා කරන ජංගම අන්තර්ජාල බ්‍රවුසරයේ වර්ගය

ඊ) යෙදුම භාවිතා කරන ආකාරය සම්බන්ධ තොරතුරු

උ) Global Positioning System (GPS) සක්‍රීය කර ඇති අවස්ථාවන්හිදී ඒ හරහා ලබාගන්නා, ජංගම උපාංගය සම්බන්ධ ස්ථානීය තොරතුරු

## යෙදුම මගින් ලබාගන්නා තොරතුරු පරීක්ෂා කිරීමට සහ/හෝ ලබාගැනීමට තුන්වන පාර්ශ්වයකට හැකියාව තිබේද?

යෙදුම මගින් ලබාගන්නා කිසිදු තොරතුරක් තුන්වන පාර්ශවයක් සමග බෙදාගනු නොලැබේ. එහෙත් සේවාවන් සම්බන්ධ දෝෂ හෝ බාධාවන් ඇති වූ අවස්ථාවකදී සහ ජංගම දුරකථන බැංකුකරණ සේවා අත්දැකීම වැඩිදියුණු කිරීම සඳහා, තොරතුරු නියැදි කට්ටල (විගණන වාර්තා/තොරතුරු ආකාරයෙන් හෝ වෙනත් ආකාරයකින්) ලබාදීමට සිදුවීමට ඉඩ ඇත.

පහත සඳහන් හේතූන් නිසා ඉහත දක්වා ඇති තොරතුරු අනාවරණය කිරීමට සිදුවීමට ඉඩ ඇත.

අ) සිතාසියකට හෝ ඒ හා සමාන නීතිමය ක්‍රියාවලියකට අනුකූල වීම වැනි නීතිමය අවශ්‍යතාවකදී

ආ) අපගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට, ඔබගේ ආරක්ෂාව හෝ අන් අයගේ ආරක්ෂාව තහවුරු කිරීමට, වංචා සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට හෝ රජයේ ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට තොරතුරු අනාවරණය කිරීම අවශ්‍ය බව අප සද්භාවයෙන් යුතුව විශ්වාස කරන අවස්ථාවකදී

අප වෙනුවෙන් කටයුතු කරන සහ, අපගේ සියලුම බැංකු ගනුදෙනු, ගනුදෙනුකරුවන් සහ ගිණුම්වල තත්ත්වය යනාදී කරුණු ඇතුළුව, මෙම රහස්‍යතා ප්‍රතිපත්තියේ දක්වා ඇති නීතිරීති වලට අදාළ තොරතුරු අනාවරණය නොකිරීමට එකඟ වී අත්සන් තබා ඇති අපගේ විශ්වාසවන්ත සේවා සපයන්නන්

## ප්‍රතික්ෂේප කිරීමට ඔබට ඇති අයිතිය

ජංගම උපාංගය ඇති ස්ථානය පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට ගනුදෙනුකරු අකමැති නම්, ඔහුට/ඇයට තම ස්මාර්ට් උපාංගයේ GPS ක්‍රියා විරහිත කළ හැක. GPS ක්‍රියා විරහිත කර ඇති අවස්ථාවකදී, අපගේ ශාඛා පිහිටා ඇති ස්ථානයන් පෙන්නුම් කිරීමේ සේවාව වැනි යම් යම් සේවාවන් නිසි පරිදි ක්‍රියා නොකිරීමට ඉඩ තිබේ.

කිසියම් ගනුදෙනුකරුවෙකුට ජංගම දුරකථන බැංකුකරණ සේවාව සඳහා ලියාපදිංචිය අවලංගු කිරීමට අවශ්‍ය නම්, තමන් ජංගම දුරකථන බැංකුකරණ සේවාව සඳහා ලියාපදිංචි වූ ශාඛාව වෙත ගොස් අදාළ ලේඛන පුරවා භාරදීම මගින් එය සිදුකළ හැකි අතර, එම යෙදුම ඉතාමත් පහසුවෙන් අදාළ ස්මාර්ට් දුරකථනයෙන්/උපාංගයෙන් ඉවත් (Uninstall) කළ හැක.

ජංගම දුරකථන බැංකුකරණ පහසුකම අවලංගු කිරීමට නම්, ඒ සම්බන්ධ ලිපිලේඛන පුරවා අදාළ ශාඛාව වෙත භාරදීම අනිවාර්ය වේ.

සේවාව අවලංගු කිරීමෙන්/ ජංගම යෙදුම ඉවත් කිරීමෙන් පසු වුවද ඒ දක්වා එක්රැස් කරගත් තොරතුරු මැකී යාමක් සිදු නොවේ. එවැනි තොරතුරු බැහැර කරනු ලබන්නේ නියාමන ආයතන මගින් නියම කර ඇති කාල සීමාවන්, නීතිමය විධිවිධාන සහ අනෙකුත් අනුකූලතාවන් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

## දත්ත රඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ පාරිභෝගික තොරතුරු කළමනාකරණය

නියාමන ආයතන මගින් නියම කර ඇති කාලසීමාවන්, නීතිමය විධිවිධාන සහ අනෙකුත් අනුකූලතාවන් සපුරාලීම සහ යෙදුම නිසියාකාරව ක්‍රියාත්මක වීම සඳහා, ජංගම දුරකථන බැංකුකරණ සේවාව සැපයීම සිදුකරන කාලය තුළ සහ ඉන් අනතුරුව සාධාරණ කාලයක් දක්වා අපි පරිශීලකයන් සපයන තොරතුරු රඳවා තබාගන්නෙමු. ඉන් අනතුරුව විධිමත් ආකාරයකට එම තොරතුරු බැහැර කෙරේ. නියාමන ආයතන මගින් නියම කර ඇති කාලසීමාවන්, නීතිමය විධිවිධාන සහ අනෙකුත් අනුකූලතාවන් සපුරාලීම සඳහා, ස්වයංක්‍රීයව එක්රැස් කරගන්නා ලද තොරතුරු සාධාරණ කාලසීමාවක් රඳවා ගනු ලබනු ඇත.

## ආරක්ෂාව

ඔබගේ තොරතුරු වල රහස්‍යභාවය සම්බන්ධයෙන් අපි අතිශයින් සැලකිලිමත් වන්නෙමු. අප භාවිතා කරන සහ පවත්වාගෙන යන තොරතුරු ආරක්ෂා කිරීම සඳහා අප භෞතික, ඉලෙක්ට්‍රොනික සහ ක්‍රියාපටිපාටිමය ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කර ඇත. උදාහරණයක් ලෙස, අපගේ යෙදුම නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා මෙම තොරතුරු අවශ්‍ය වන බලයලත් සේවකයන්ට සහ තුන්වන පාර්ශ්වයන්ට හැර වෙනත් කිසිදු පාර්ශ්වයකට මෙම තොරතුරු භාවිතා කිරීමට අවසර නැත. මෙම තොරතුරු සඳහා සාධාරණ ආරක්ෂාවක් සැපයීමට අප හැකි උපරිමයෙන් කටයුතු කරන නමුත්, කිසිදු ආරක්ෂක පද්ධතියකට ආරක්ෂාව සම්බන්ධ සියලු තර්ජන සපුරාම වැළැක්විය නොහැකි බව කරුණාවෙන් සලකන්න.

අපගේ ජංගම බැංකුකරණ යෙදුම ස්ථාපනය කර ඇති තොරතුරු තාක්ෂණ වත්කම් (ඊමේල් ගිණුම් සහ ජංගම උපාංගවලට පමණක් සීමා නොවේ) සුරක්ෂිත බව සහතික කිරීමට ගනුදෙනුකරුවන්ටද සමාන වගකීමක් ඇති අතර, එවැනි දේවල් පාලනය කිරීමට අමානා බැංකුවට හැකියාවක් නොමැත. පොදුවේ මුහුණ දීමට සිදුවන අවදානම් සහ ඒවා සම්බන්ධයෙන් ගතහැකි ආරක්ෂක ක්‍රියාමාර්ග කිහිපයක් පහත දක්වා තිබේ.

අ) බාහිර පුද්ගලයින්ට මුරපද අනාවරණය වීම, අන් අයට පෙනෙන ස්ථාන වල මුරපද ලිවීම, සහ අනවසර පුද්ගලයින් විසින් සිදුකරන phishing සහ key logger ස්ථාපිත කිරීම නිසා ඇතිවන ගැටලු

පරිශීලක ස්මාර්ට් උපාංගයේ හානිකර පරිගණක වැඩසටහන් වලට එරෙහිව ක්‍රියාකරන (Antivirus) යෙදුමක් ස්ථාපනය කිරීම, ස්ථාපනය කර ඇති නව යෙදුම් පරීක්ෂා කිරීම, අනවශ්‍ය

යෙදුම් ස්ථාපනය වී ඇත්දැයි පරීක්ෂා කිරීම සහ ඒවා ඉවත් කිරීම, තම පසුම්බියේ මුදල් ආරක්ෂා කරන්නාක් මෙන් මුරපද මුරපද ආරක්ෂා කිරීම, ඊමේල්, SMS, MMS සහ සමාජ මාධ්‍ය හරහා එවන සැකසහිත සබැඳි ක්ලික් කිරීමෙන් වැළකීම වැනි ක්‍රම මගින් මේවා වළක්වා ගත හැකි ය.

ආ) අනවසර පුද්ගලයන්ට පහසුවෙන් අනුමාන කළ හැකි සරල මුරපද භාවිතා කිරීම

ශක්තිමත් මුරපදයක් ප්‍රමාණවත් තරම් දීර්ඝ විය යුතු ය (අකුරු 8 හෝ ඊට වැඩි); සංකීර්ණ විය යුතු ය (ඉලක්කම්, විශේෂ අක්ෂර සහ සිම්පල් කැපිටල් සම්මිශ්‍රණය කිරීම වැනි). මුරපදය නිතර (අවම වශයෙන් සෑම දින 30 කට වරක්) වෙනස් කිරීම සුදුසු ය. වසරක් තුළ එකම මුරපදය දිගින් දිගටම භාවිතා නොකරන්න. පළමු පිවිසුමේදී භාවිතා කළ මුරපදය හැකි ඉක්මනින් වෙනස් කරන්න.

## වෙනස්කම්

මෙම රහස්‍යතා ප්‍රතිපත්තිය, අවශ්‍ය පරිදි වෙනස් කරනු ලබන ලේඛනයකි. එම නිසා එය වඩාත් ශක්තිමත් කිරීමටත්, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ රහස්‍යතාව සම්බන්ධ නව ප්‍රවණතා වලට අනුගත වීමටත් එය වරින් වර යාවත්කාලීන කරනු ලැබීමට ඉඩ තිබේ. අපගේ රහස්‍යතා ප්‍රතිපත්තියේ යම් වෙනසක් සිදු වී ඇත්නම් එය අපගේ නිල වෙබ් අඩවියෙහි පළ කිරීම මගින් සහ, ජංගම බැංකු සේවා ලියාපදිංචියේදී ලබා දී ඇති විස්තර මත පදනම්ව විද්‍යුත් තැපෑලෙන් හෝ කෙටි පණිවිඩයක් මගින් ඔබ වෙත දැනුම් දෙනු ඇත. වෙනස්කම් සිදු වී ඇත්දැයි දැනගැනීම සඳහා නිතර මෙම රහස්‍යතා ප්‍රතිපත්තිය පරිශීලනය කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## ඔබගේ අනුමැතිය

යෙදුම බාගත කිරීම, ස්ථාපනය කිරීම සහ/හෝ භාවිතා කිරීම මගින්, මෙම රහස්‍යතා ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි ඔබේ තොරතුරු භාවිතා කිරීම සඳහා ඔබ විසින් එකඟත්වය පළකරන ලද ලෙස සැලකේ. මෙහි ‘තොරතුරු භාවිතා කිරීම’ යන්නෙන් තොරතුරු රැස් කිරීම, ගබඩා කිරීම, මකා දැමීම, අදාළ අරමුණු වෙනුවෙන් භාවිතා කිරීම, ඒකාබද්ධ කිරීම සහ හෙළිදරව් කිරීම ඇතුළුව ඕනෑම ආකාරයකින් තොරතුරු භාවිතා කිරීම අදහස් වන අතර, මෙම ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුළ සිදුකෙරේ. ඔබ ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නේ නම්, ඔබේ තොරතුරු ශ්‍රී ලංකාවට අදාළ රහස්‍යතා ප්‍රමිතීන්ට යටත්ව මෙරටට මාරු කිරීම, පිරිසැකසුම් කිරීම සහ ගබඩා කිරීම සිදු කෙරෙනු ඇත.

## අප හා සම්බන්ධ වන්න

යෙදුම භාවිතා කිරීමේදී රහස්‍යභාවය ආරක්ෂා වීම සහ/හෝ, අප අනුගමනය කරන ක්‍රමවේදයන් ආදිය පිළිබඳව ඔබට යම් ගැටලුවක් වේ නම් කරුණාකර අප හා සම්බන්ධ වන්න.

ලිපිනය: අමානා බැන්ක් පීඑල්සී, ප්‍රධාන ශාඛාව, 480, ගාලුපාර, කොළඹ 03

දුරකථන: +94 11 7 756 756

ෆැක්ස්: +94 11 4 718 148

ඊමේල්: contact@amana.lk

වෙබ අඩවිය: www.amanabank.lk